# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශය

## දෙවන ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

**ඉස්ලාම්**

**දෙවන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය - 2016**

© **ජාතික අධ්‍යාපන ආයතනය**

ISBN .................

**මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ  සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත.  පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත.  සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ.  එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය  වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද,  රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද, සුභාවිත තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද, මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද, අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ සහ සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුම ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක් වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි තේමා සහ නිපුණතා සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද, දෙගුරුනට ද, භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරු භවතුන් පෙළ පොත හා මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයවල සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැ යි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය, පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය :**

**උපදේශකත්වය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමින් වහන්සේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

ඉසෙඩ්. තාජුදීන් මයා
අධ්‍යක්ෂ (ඉස්ලාම් ආගම හා සාරධර්ම), අධ්‍යාපන අමාත්‍යාංශය

මෞලවි එම්. අයි. එම්. නව්ෆර්දීන් මයා
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය

එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා
අධ්‍යක්ෂ (මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන),
ජාතික අධ්‍යාපන ආයතනය.

**අනුමතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : ඩබ්ලිව්. ජී. එස්. කුමාර මයා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය.

කේ. ආර්. එම්. සකුන්තලා රණසිංහ මිය
සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය :**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය -**

අශ්ශේක් ජේ. එම්. ජේසාර් මයා,
සහකාර කථිකාචාර්ය, ආගම් හා සාරධර්ම දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

**බාහිර සම්පත් දායකත්වය -**

එස්. එම්. ආර්. සූදීන් මයා
විශ්‍රාමික ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. එච්. එම්. නාලිර් මයා, විශ්‍රාමික (ගුරු සේවය)

අශ්ශේක් එම්. එච්. එම්. බුහාරි මයා
ගුරු උපදේශක, මිනුවන්ගොඩ කලාප අධ්‍යාපන කලාපය

අශ්ශේක් එම්. ඒ. එම්. බිස්තාමි මයා (ගුරු සේවය)
බප/කැල/අල් මුබාරක් කනිටු විදුහල, මල්වාන

ජී. එම්. එම්. රZසූල්ඩීන් මිය (ගුරු සේවය) අල් හික්මා විදුහල, කොළඹ

යෙස්මින් හිZසාර් මිය (ගුරු සේවය) සහිරා විදුහල, කොළඹ

**භාෂා සංස්කරණය** : ශ්‍රීනාත් ගනේවත්ත මයා (භාෂා සංස්කාරක)

**විෂය සංස්කරණය** : අශ්ශේක් ජේ. එම්. ජෙසාර් මයා, සහකාර කථිකාචාර්ය,
ආගම් හා සාරධර්ම දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**පරිගණක වදන් සැකසුම** : බී. ඒ. එන්. බටවල මිය

**විවිධ සහය** : ඩබ්. එච්. ටී. සිල්වා මයා
එස්. පී. ඒ. සරත් කුමාර මයා

# හැඳින්වීම

ජාතික අරමුණු ඉටු කර ගැනීම සඳහා පාදක වන මූලික නිපුණතා ඇසුරින් 'ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා' දරුවන් තුළ ගොඩනැංවීම 'ආගම' විෂයයේ වගකීම වෙයි.

කුඩා දරුවකුගේ ළපටි මනසෙහි අලුත් යමක් රෝපණය කිරීම පහසු ය, එ සේ ම යහපත් චර්යාවලට සහ වත් පිළිවෙත්වලට කුඩා දරුවකු අනුගත කිරීම ද වඩා ඉක්මනින් කළ හැකි ය. කුඩා දරුවකු තුළ පවත්නා එම ගුණාංගවලට මනා ව ගැළපෙන සේ මෙහි විවිධ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත. විෂය අන්තර්ගතයට අනුකූල ව සිසු දරුවාට අදාළ නිපුණතාව ලබා දෙමින් ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීමට එම ක්‍රියාකාරකම් ඔබට මාර්ගෝපදේශයක් වනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

සමාජයක සාමය සහ සදාචාරය පවත්වා ගැනීමට සියලු ම ආගම්වලින් ලැබෙන දායකත්වය සුළුපටු නො වේ. තව ද, තමා හැම අයුරින් ම පෝෂණය කර ගුණාත්මක ජීවිතයක් ගත කිරීමට ශ්‍රම දායකත්වය සපයන මිනිස් සමාජයට කෘතවේදී වෙමින් පෙරළා අවංක සේවයක් කිරීමටත්, යහගුණවලින් හෙබි මනුෂ්‍යයකු ලෙස අභිමානයෙන් යුතු ව ජීවත් වීමටත්, ආගමකින් ලැබෙන පන්නරය අතිමහත් ය. එ පමණක් නො ව අප එකිනෙකා විශ්වාස කරන පරිදි මරණින් ඔබ්බෙහි දී ද යහපතක් උදා කර ගැනීම සඳහා ආගමික ඉගැන්වීම් අපට නිසැක ව ම පිහිට වෙයි.

දැහැමි සමාජයක් බිහි කිරීමේ උදාර කර්තව්‍යය ආරම්භ කළ යුත්තේ ප්‍රාථමික අවධියේ කුඩා දරුවා ගෙනි. ඒ මහඟු කර්තව්‍යය භාර ගෙන සිටින භාග්‍යවන්ත වූ ගුරු භවතා ඔබ යි. ඒ සඳහා ඔබෙන් ලැබෙන දායකත්වය සහ කැප වීම මහත් සේ අගයමු.

**එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න**

**අධ්‍යක්ෂ**

**මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව.**

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුම්වත් වීම සහ හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

## i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

## iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය


vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**


සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ප්‍රාථමික විෂයමාලා සැලැස්ම



# කාලය බෙදා ගැනීම

## පළමු වන ප්‍රධාන අවධිය (පළමු වන සහ දෙ වන ශ්‍රේණි)

| | **විෂයය** | **සතියකට වෙන් කර ඇති කාලය** |
|---|---|---|
| 1. | මවු බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 3.30 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 5.30 |
| 4. | ආගම | පැය 1.15 |
| 5. | දෙවන ජාතික භාෂාව | මිනිත්තු 30 |
| 6. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 7. | විවේක කාලය | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 8. | ආහාර ගැනීම සඳහා | මිනිත්තු 50 (දිනකට මිනිත්තු 10 බැගින්) |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 1.40 (දිනකට මිනිත්තු 20 බැගින්) |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 (සතියේ එක් දිනෙක) |
| | **සතියක මුළු කාලය** | **පැය 21.15** |

# ඉස්ලාම් ගුරු මාර්ගෝපදේශය පරිශීලනයට උපදෙස්

ඉස්ලාම් යනු ජීවන මාර්ගයකි. මෙම විෂයය සකස් වන්නේ එම ජීවන මාර්ගය හැදෑරීමේ ක්‍රමයක් වශයෙනි. බාල පරපුර විවිධ ආයතන මඟින් ඉස්ලාම් විෂයය හදාරන මුත් ගුරුවරයකුගේ මඟ පෙන්වීම සහිත ව සිදු වන අන්‍යෝන්‍ය සන්නිවේදනය සහිත පාසල් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මඟින් ඉස්ලාම් ධර්මය සිසුන්ගේ සිත්සතන්වල සටහන් කිරීමත්, ඔවුන්ගේ ප්‍රායෝගික ජීවිතයට කාවැද්දීමත්, වඩා පහසු ය.

ආගමික අධ්‍යාපනයේ අවශ්‍යතාව වත්මන් සමාජ පරිසරයෙහි දී කැපී පෙනෙයි. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාවේ අන්තර්ගත ආචාර ධර්මවලට හා ආගමට අදාළ නිපුණතා පමණක් නොව සෙසු නිපුණතා වර්ධනය සඳහා ද ඉස්ලාම් ධර්මයට විශාල මෙහෙයක් කළ හැකි ය. ඒ ඔස්සේ ජාතික පොදු අරමුණු කරා ළඟා වීමට ඉවහල් වන පරිදි ප්‍රාථමික අවධියේ ඉස්ලාම් ධර්මය විෂය නිර්දේශය සැකසී ඇත.

## ප්‍රාථමික අවධිය සඳහා වන නිපුණතා

- අල්ලාහ් සිටින බව පිළිගෙන සැම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි.
- අර්කානුල් ඊමාන් පිළිගෙන ක්‍රියාත්මක කරයි.
- අර්කානුල් ඉස්ලාම් පිළිගෙන ක්‍රියාත්මක කරයි.
- එදිනෙදා ජීවිතයේ දී මුස්ලිම්වරුන් පිළිපැදිය යුතු සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරයි.
- දෛනික ජීවිතයේ දී මුස්ලිම් ආචාර ධර්ම අඛණ්ඩ ව පිළිපදියි.
- සාමූහික ජීවිතයට අදාළ ගුණධර්ම හා සාරධර්ම (අහ්ලාක් හා ආදාත්) පිළිපදියි.
- නබි (සල්) තුමාණන් කෙරෙහි සෙනෙහසින් යුතු ව එතුමාණන්ගේ ආදර්ශ පිළිපදිමින් ජීවත් වෙයි.
- අල් කුර්ආනය හැදින, පාරායණය කර, එහි උපදෙස් පිළිපදියි.
- මස්ජිදය මුස්ලිම්වරුන්ගේ පූජනීය ස්ථානය බව ප්‍රකාශ කරයි.
- ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විද්වතුන්ගේ ප්‍රතිපත්ති අගය කරමින් ඒවා ආදර්ශයට ගනියි.

**1 - 5 ශ්‍රේණි තෙක් ප්‍රාථමික අවධියේ ඉස්ලාම් ධර්මය පිළිබඳ ඉගෙනුම් අත්දැකීම් ලබන සිසුන්, ප්‍රාථමික අවධිය අවසාන කරන විට උක්ත නිපුණතාවලට ළඟා වනු ඇතැ යි අපේක්ෂා කෙරේ. ඒ සඳහා අදාළ විෂය අන්තර්ගතය, විෂය නිර්දේශවල දක්වනු ලබන අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා යෝජනා කර ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය වඩාත් නිර්මාණශීලී ව භාවිත කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක් ලෙස පමණක් පෙළ පොත යොදා ගැනීම සුදුසු ය.**

### ඉගැන්වීමේ ක්‍රමෝපාය

ප්‍රාථමික ශ්‍රේණිවල ඉස්ලාම් ඉගැන්වීමේ දී කුඩා දරුවන් ප්‍රිය කරන ආගමික ජීවිතය හා සමීප ක්‍රියාකාරකම් බහුල ලෙස යොදා ගත යුතු වේ. ආගමික චාරිකා, මස්ජිදය නැරඹීම, වත්පිළිවෙත් මේ අතර ප්‍රධාන තැනක් ගනියි.

තව ද ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විද්වතුන් ගේ තොරතුරු, නබි (සල්) තුමාණන් සම්බන්ධ ආදර්ශවත් කථා දෘශ්‍යාධාර සමඟ රසවත් ව ඉදිරිපත් කළ යුතු ය. මේ හා සම්බන්ධ ගායනා, රංගන, චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්ය මුසු ක්‍රියාකාරකම්වල දරුවන් නිරත කරවීමට ද නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු වෙයි. එය ශිෂ්‍යයාට වින්දනයක් ගෙන දෙන ලෙස ඉතා ම සුන්දර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් බැවින් එම ක්‍රමවේද සියල්ල මඟින් ඉස්ලාම් ඉගෙනීමට දැඩි ආශාවක් දරුවන් තුළ ඇති වනු ඇත. එ මෙන් ම දරුවා තුළ ක්‍රමයෙන් අල්ලාහ් පිළිබඳ විශ්වාසය තහවුරු කිරීමක් ද සිදු වේ.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් ඉස්ලාම් විෂයය සම්බන්ධ බොහෝ නිපුණතා ආවරණය කළ හැකි ය. එසේ ම තහවුරු කළ හැකි ය. තව ද පාසල් සංස්කෘතියෙහි ලා මෙම නිපුණතා ගොඩ නැඟෙන නව අංග ඇති කිරීම කෙරෙහි ද විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. පළමු වන ශ්‍රේණියේ දී ඉතා සරල ව අරඹා පස් වන ශ්‍රේණිය තෙක් මෙම වැඩසටහන ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

පවිත්‍රතාව, විනීත බව, සහයෝගය, ගුරුවරුන් කෙරෙහි පැවැත්විය යුතු ආචාර ධර්ම, ආශීර්වාද ඇසුරෙන් ගොඩ නැඟෙන සමානාත්මතාව, සුහදතාවය, සහෝදරත්වය ආදි ලක්ෂණවලින් පාසල් පරිසරය හා සම්බන්ධ සංස්කෘතිය අලංකාර කෙරේ. ඉහත සංස්කෘතියෙහි ලා ඉස්ලාම් විෂයයෙන් අපේක්ෂිත නිපුණතා වර්ධනය වන අවස්ථා උදා කළ හැකි ය. මෙ මඟින් විෂය අන්තර්ගතය තුළ ඇති සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

## තක්සේරු කිරීම

ප්‍රාථමික ශ්‍රේණිවල දී ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් මේ සඳහා උචිත වෙයි.

**ව්‍යාපෘති නායක**

# පටුන


| | පිටුව |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| හැඳින්වීම | vi |
| ජාතික අරමුණු | vii |
| මූලික නිපුණතා | viii - ix |
| විෂයමාලා සැලැස්ම | x |
| කාලය බෙදා ගැනීම | xi |
| ඉස්ලාම් ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | xii - xiii |
| පටුන | xiv |
| විෂය නිර්දේශය හා ඉගෙනුම් සැලැස්ම | xv |
| ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රියාවලිය | 1 |

# විෂය නිර්දේශය

# හා

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා

# උපදෙස්

# විෂය අරමුණු

1. දරුවන් තුළ අල්ලාහ් පිළිබඳ විශ්වාසය තහවුරු කිරීම

2. අල්ලාහ් විසින් මුහම්මද් නබි (සල්) තුමාට පහළ කරන ලද අල් කුර්ආනයට නිසි ගෞරව දැක්වීමටත්, ඒ අනුව ජීවිතය හැඩගස්වා ගැනීමටත්, යොමු කිරීම

3. ඊමාන්(විශ්වාස) කළ යුතු කරුණු හය පිළිපදිමින් ඉස්ලාමීය ප්‍රතිපත්ති ඇති කර ගැනීමට මග පෙන්වීම

4. නබිවරු ඇතුළු සලෆුස්සාලිහීන්වරුන්ගේ චරිතාපදාන ඇසුරින් ලබා ගන්නා ආදර්ශවලට අනුකූල වූ ජීවන දර්ශනයක් ගොඩනැංවීම

5. ඉස්ලාමීය සිරිත්විරිත් පිළිපදින්නා වූත්, මුස්ලිම් අනන්‍යතාව ප්‍රදර්ශනය කරන්නා වූත්, චර්යා ඇති කිරීම

6. දික්ර්, අව්රාද්, සහ සූරා නිවැරැදි ව උච්චාරණය කරමින් පාරායනය කිරීමටත්, විශ්වාසයෙන් යුතු ව ආගමික වතාවත්වල නිරත වීමටත්, පුරුදු පුහුණු කරවීම

7. මස්ජිදය දේව නිවස වශයෙන් සලකා ගෞරව කිරීමට පෙලඹවීම

8. ඉස්ලාමයේ ඉගැන්වෙන පරිදි සියල්ලන්ට ම ආදරය දැක්වීම, උදව් කිරීම, අසල්වැසියන් සමග එකමුතු ව ජීවත් වීම සම්බන්ධ අත්දැකීම් ලබා දීම

9. උපවාසයෙහි යෙදීමේ ප්‍රතිපත්තිමය වටිනාකමත්, හජ් වන්දනාව ඉටු කිරීමේ වැදගත්කමත් පිළිබඳ අවබෝධයක් ලබා දීම

10. අන්‍යාගමික සිරිත්වලට ගරු කරමින් සහයෝගයෙන් ජීවත් වීමේ ආකල්ප රෝපණය කිරීම

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1.0 අල්ලාහ් සිටින බව පිළිගෙන සැමවිට ම අල්ලාහ් සිහිපත් කිරීම. | 1.0 අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි. | 1.1 අල්ලාහ් - මැවුම්කරු<br>• අල්ලාහු රබ්බුල් ආලමීන්<br>• නින්දෙන් අවදි වූ වෙලාවේ සිට නින්දට යන තෙක් ම සියලුම අවස්ථාවල අල්ලාහ් පිළිබඳ සිහිපත් කිරීම |
| 2.0 අර්කානුල් ඊමාන් | 2.0 අර්කානුල් ඊමාන් පිළිගෙන ක්‍රියාත්මක කරයි. | 2.1 අර්කානුල් ඊමාන්<br>• ඊමාන් කළ යුතු කරුණු පිළිබඳ දැන ගැනීම<br>• මලාඉකාවරුන් පිළිබඳ විශ්වාස (ඊමාන්) කිරීම |
| 3.0 අර්කානුල් ඉස්ලාම් | 3.0 අර්කානුල් ඉස්ලාම් පිළිගෙන ක්‍රියාත්මක කරයි. | 3.1 අර්කානුල් ඉස්ලාම්<br>• අල් කලිමතුෂ් ෂහාදා<br>• අල් අදාන් වල් ඉකාමත් |
| 4.0 අත්තහාරා | 4.0 එදිනෙදා ජීවිතයේ දී මුස්ලිම්වරුන් පිළිපැදිය යුතු සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරයි. | 4.1 පෞද්ගලික පවිත්‍රතාව<br>• ශරීරය පිරිසිදු ව තබා ගැනීම<br>* නියපොතු * හිස * පාද<br>• අවට පරිසරය පිළිබඳ ව සැලකිලිමත් වීම<br>* කිවිසුම් හැරීමේ දී<br>* ඇනුම් හැරීමේ දී<br>* කෙළ ගැසීමේ දී<br>* පන්ති කාමරය පිරිසිදු ව තබා ගැනීමේ දී |
| 5.0 ඉස්ලාමීය ආචාර ධර්ම | 5.0 දෛනික ජීවිතයේ දී මුස්ලිම්වරුන් පිළිපැදිය යුතු ඉස්ලාමීය ආචාර ධර්ම අඛණ්ඩ ව පිළිපදියි. | 5.1 ඉස්ලාමීය ආචාර ධර්ම අනුගමනය කිරීම<br>• නිදා ගැනීමේ දී<br>• නින්දෙන් අවදි වූ පසු<br>• ශරීර කෘත්‍යයේ දී |
| 6.0 අඛ්ලාක් සහ අදාබ් | 6.0 සාමූහික ජීවිතයට අදාළ ගුණධර්ම හා සාරධර්ම (අඛ්ලාක් හා අදාබ්) පිළිපදියි. | 6.1 ගුරුවරුනට, ආලිම්වරුන්ට සහ අසල්වැසියන්ට ආදරය දැක්වීම, ඔවුන්ගේ යහපත් ඔවදන්වලට කීකරු වීම/උදවු කිරීම.<br><br>6.2 ආදර්ශවත් මුස්ලිම් දරුවකු සතු විය යුතු යහපත් ගුණාංග |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| **7.0 නබි (සල්) තුමාණන් ගේ ආදර්ශ** | 7.0 නබි (සල්) තුමාණන් කෙරෙහි සෙනෙහසින් එතුමා ගේ ආදර්ශ පිළිපදිමින් ජීවත් වෙයි. | 7.1 මුහම්මද් (සල්) තුමාණන් ගේ කුඩා අවධිය<br>• ඉපදීමට පෙර ම පියා වියෝ වීම<br>• හලීමා තුමිය කිරි මව වීම<br><br>7.2 නබි (සල්) තුමාණන් ගේ පූර්වාදර්ශ<br>• මුළු ලෝකයට ම ආදර්ශවත් පුද්ගලයකු වීම<br>• දරුවන් කෙරෙහි ආදරය දැක්වීම<br>• යටහත් බව හා හික්මීම |
| **8.0 අල් කුර්ආනය** | 8.0 අල් කුර්ආනය හැඳින, පාරායනය කර, එහි උපදෙස් පිළිපදියි. | 8.1 සූරතුල් ඉඛ්ලාස් |
| **9.0 මස්ජිද්** | 9.0 මස්ජිදය මුස්ලිම්වරුන් ගේ පූජනීය ස්ථානය බව ප්‍රකාශ කරයි. | 9.1 මස්ජිදයට යෑම සම්බන්ධ පිළිවෙත්<br>• මස්ජිදයට යෑමට පෙර<br>• මස්ජිදය තුළ |
| **10. ඉස්ලාමීය ඉතිහාසය** | 10.0 ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විද්වතුන් ගේ ප්‍රතිපත්ති අගය | 10.1 අබ්දුල් කාදිර් ජීලානි (රහ්) තුමා |

# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශය

### දෙවන ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**


මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

# 1.0 තේමාව : අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි.

**නිපුණතාව 1.0** : අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි.

**නිපුණතා මට්ටම 1.1**:
- අල්ලාහ්ගේ මැවුම් පිළිබඳ සිහිපත් කරයි.
- මැවූ සියල්ල වර්ග කර හඳුනා ගනියි.
- අල්ලාහ් සිහිපත් කර ස්තුති කරයි.

**ඉගෙනුම් පල** :
- අහස, පොළොව ඇතුළු සියල්ලෙහි මැවුම්කරු අල්ලාහ් බව විශ්වාස කර පවසයි.
- සියල්ලෙහි මැවුම්කරු 'රබ්බුල් ආලමීන්' ලෙස පිළිගෙන පවසයි.
- අල්ලාහ් සියල්ල ම පරිපාලනය කරන බව පිළිගෙන කියයි.

**ඉගෙනුම් සම්පත්** :
- 'රබ්බුල් ආලමීන්' නම් වැකිය අරාබියෙන් ලියන ලද පත්‍රිකා
- මැවුම් ප්‍රදර්ශනය කරන පින්තූර

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- අල්ලාහ්ගේ මැවුම් කෙරෙහි අවධානය යොමු කරවන්න.
- මැවුම් හඳුනා ගෙන වර්ග කරන්න.
- ඒවායේ හැඩය, පාට. ප්‍රමාණ අනුව වර්ග කරන්න.
- ඒවායේ උපත, වර්ධනය, විපත, ප්‍රයෝජන පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මේ සියල්ල මවා අප හට ලබා දී ඇත්තේ අල්ලාහ් බව පහදා දෙන්න.
- ඔහුට කෙසේ ස්තුති කළ යුතු ද යන්න පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මැවුම් කිහිපයක් ගැන ඒවා අල්ලාහ් විසින් පරිපාලනය කරන ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න.
  *උදා* : * ගසක්, පැළෑටියක් - මිනිසා වගා කරයි.
  * අල්ලාහ් විසින් වාතය, හිරු එළිය, ජලය ලබා දී එය පෝෂණය කරයි.
  * ජෛව ප්‍රජාවගේ වර්ධනයට උදවු දෙයි.
- ''මැවුම්කරු අල්ලාහ්'' යන 1 වන පාඩම යොදා ගන්න.

**ක්‍රියාකාරකම 2**

- පින්තූර කිහිපයක් සකසා ගන්න.
  * කුරුලු මව පැටවුන්ට ආහාර ලබා දීම.
  * එළදෙන වසු පැටියාට කිරි ලබා දීම
  * වෛද්‍යවරයා විසින් රෝගියකු පරීක්ෂා කිරීම
  * ගොවියකු බෝග වගා කිරීම

  මෙවැනි පින්තූර සිසුන්ට පෙන්වා ඒ පිළිබඳ විමසන්න.
- මේ සියල්ල මැවූ අල්ලාහ් ඒවා නිසි ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය දේ ද සපයා ඇත.
- මේ නිසා 'අල්ලාහ් රබ්බුල් ආලමීන්' ලෙස හැඳින්වේ.
- 'අල්ලාහ් සිහිපත් කරමු' යන 2 වන පාඩම උපයෝගී කර ගන්න.

**තක්සේරුව :**

- අල්ලාහ්ගේ මැවුම්වල නම් කියයි.
- ඒවා වර්ග කර කියයි.
- ඒවා පරිපාලනය වන අයුරු පවසයි.
- ''රබ්බුල් ආලමීන්'' යන වැකිය නිවැරදිව උච්චාරණය කරයි.
- ''සියල්ල මවා පරිපාලනය කරන්නා'' යන අර්ථය හඳුනා ගනියි.
- ප්‍රායෝගික ජීවිතයේ දී සැම විට ම අල්ලාහ්ට ස්තුතිය පුද කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අල්ලාහ්ගේ මැවුම් දැක නිතර අල්ලාහ්ට ස්තුතිවන්ත වීම.

## 2.0 තේමාව : අර්කානුල් ඊමාන් පිළිබඳ ව දැන පවසයි.

**නිපුණතාව 2.0** : අර්කනුල් ඊමාන් පිළිබඳ අවබෝධ කරගෙන තමා ද ක්‍රියාත්මක වී අනෙකුත් අයට පවසයි.

**නිපුණතා මට්ටම 2.1** :
- මලාඉකාවරුන් පිළිබඳ ව දැන ගැන පවසයි.
- ඔවුන්ගේ කාර්යාරය දැන පවසයි.

**ඉගෙනුම් පල** :
- ඊමාන් කළ යුතු අංග කළ පවසයි.
- ඒවා ප්‍රායෝගික ජීවිතයට අදාළ කර පිළිපදියි.
- මලාඉකාවරුන් පිළිබඳ ව විශ්වාස කර ක්‍රියා කරයි.
- ප්‍රධාන මලාඉකාවරුන් 4 දෙනකුගේ නම් හා ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳ ව පවසයි.

**ඉගෙනුම් සම්පත්** :
- 'ආමන්තු බිල්ලාහ්' ලෙස අරාබියෙන් ලියන ලද පත්‍රිකා
- මලාඉකාවරුන්ගේ නම් හා කාර්ය සඳහන් වගුවක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න. (උචිත)
- පිරිසිදු ඇතිරිල්ලක වාඩි කරවන්න.
- ''ආමන්තු බිල්ලාහ්'' අරාබියෙන් ලියන ලද පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.
- එය නිවැරදි ව උච්චාරණයට යොමු කරවන්න.
- ආමන්තු බිල්ලාහ් යන 3 වන පාඩම යොදා ගන්න.

**ක්‍රියාකාරකම 2**

- පියෙවි ඇසට නොපෙනෙන අල්ලාහ්ගේ මැවුම් පිළිබඳ විමසන්න.
- මලාඉකාවරුන් ද අල්ලාහ්ගේ මැවුම් බව වටහා දෙන්න.
- මලාඉකාවරුන් පිළිබඳ පහත කරුණු කියා දෙන්න.
  - * ඔවුන් ආලෝකයෙන් මවා ඇත.
  - * ඔවුන් අතර ගැහැනු පිරිමි භේද නැත.
  - * ඔවුන් අල්ලාහ්ගේ අණ පමණක් පිළිපදියි.
- මලාඉකාවරුන් පිළිබඳ ව විශ්වාස කිරීම අපගේ වගකීම වේ.

**ක්‍රියාකාරකම 3**

- පළමු ප්‍රධාන මලාඉකාවරුන් 4 දෙනාගේ නම් කාඩ්බෝඩ් තීරුවල ලියා පෙට්ටියකට දමන්න.
- එම මලාඉකාවරුන් 4 දෙනාගේ කාර්යභාරය වෙන වෙන ම කාඩ්බෝඩ් තීරුවල ලියා තවත් පෙට්ටියකට දමන්න.

| මලාඉකාවරු | කාර්යභාරය |
| --- | --- |
| ජිබ්රිල් | අල්ලාහ්ගෙන් වහී ගෙන ඒම |
| මීකායීල් | ආහාර, වැස්ස, සුළඟ ඇති කිරීම |
| ඉස්රායීල් | ජීවිත අත්පත් කර ගැනීම |
| ඉස්රාෆීල් | සූර් නළාව පිඹීම |

- සිසුන් කණ්ඩායම් 2කට වෙන් කරන්න.
- ගුරුවරියගේ විධානයට (සංඥාව) අනුව පළමු කණ්ඩායමේ සිසුවකු ඉදිරියට පැමිණ කාඩ්පත් බහා තිබෙන පෙට්ටියෙන් කාඩ්පතක් රැගෙන අනෙකුත් සිසුන්ට ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.
- දෙවන කණ්ඩායමේ සිසුවකු පැමිණ එම මලාඉකාවරයාට අදාළ කාර්යභාරය තෝරා ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.
- මෙලෙස සියලු සිසුන් සහභාගි කරවා ගෙන මෙම ක්‍රියාකාරකම කරවන්න.
- සියලු සිසුන්ට මලාඉකාවරුන්ගේ නම් හා කාර්යභාරය නිවැරදි ව හඳුනාගෙන පැවසීමට අවස්ථාව සලස්වන්න.
- මේ හැර වෙනත් උචිත ක්‍රීඩා ක්‍රම ද උපයෝගී කර ගන්න.
- ''මලාඉකාවරුන් පිළිබඳ ව විශ්වාස කරමු'' යන 3 හා 4 පාඩම් ද යොදා ගන්න.

**තක්සේරුව**

- මලාඉකාවරුන් පිළිබඳ ව විශ්වාස කළ යුතු බව පවසයි.
- ප්‍රධාන මලාඉකාවරුන් 4 දෙනාගේ නම් පවසයි.
- ඔවුන්ගේ කාර්යභාරය පවසයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අල්ලාහ්ගේ කාර්යවලට මලාඉකාවරුන්ගේ දායකත්වය පිළිබඳ ව විශ්වාසයෙන් කටයුතු කරයි.

## 3.0 තේමාව : අර්කානුල් ඉස්ලාම් පිළිබඳ ව දැන ගෙන ක්‍රියාත්මක කරයි.

**නිපුණතාව 3.0** : අර්කානුල් ඉස්ලාම් පිළිගෙන ක්‍රියාත්මක කරයි.

**නිපුණතා මට්ටම 3.1** :
- ''බුනියල් ඉස්ලාම්'' ලියන ලද පත්‍රිකාව කියවයි.
- කලිමතුෂ් ෂහාදාව නිවැරදි ව කියයි.
- කලිමතුෂ් ෂහාදාවේ තේරුම කියයි.
- අදාන් කියන විට සංවර ව සිටියි.

**ඉගෙනුම් පල** :
- ''බුනියල් ඉස්ලාම්'' යන්න නිවැරදි ව උච්චාරණය කරයි.
- කලිමතුෂ් ෂහාදාව නිවැරදි ව උච්චාරණය කරයි.
- එහි තේරුම කියයි.
- අදාන් කියන විට සංවර ව සාවධාන ව සවන් දෙයි.
- අදාන් කියන ආකාරය කට පාඩම් කර පවසයි.

**ඉගෙනුම් සම්පත්** :
- කලිමතුෂ් ෂහාදාව ලියන ලද පත්‍රිකා /CD තැටි
- පාට කුරු
- කලිමතුෂ් ෂහාදාවේ තේරුම ලියන ලද පත්‍රිකා/CD තැටි
- අර්කානුල් ඉස්ලාම් ලෙස ලියන ලද පත්‍රිකා

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- ''අර්කානුල් ඉස්ලාම්'' ලෙස ලියන ලද පත්‍රිකා කණ්ඩායමට එක බැගින් ලබා දෙන්න.
- එය වර්ණවත් කිරීමට අවශ්‍ය පාට කුරු ලබා දෙන්න.
- සිසුන් කැමති ආකාරයට අලංකාරවත් ලෙස වර්ණ කිරීමට යොමු කරවන්න.
- ''බුනියල් ඉස්ලාම්'' නම් 5 වන පාඩම උපයෝගී කර ගන්න.

**ක්‍රියාකාරකම 2**

- සිසුන් පන්ති කාමරයෙන් පිටත එළිමහන් තැනකට රැගෙන ගොස් රවුමක් ආකාරයට පෙළ ගස්වන්න.
- කලිමතුෂ් ෂහාදාව දන්නා සිසුවකුට ඉදිරියට පැමිණ එය පැවසීමට කියන්න.
- කලිමතුෂ් ෂහාදාව ලියන ලද පත්‍රිකාව ප්‍රදර්ශනය කර ගුරුවරිය සිසුන් සමඟ කියන්න.
- කණ්ඩායම් ලෙස කලිමතුන් ෂහාදාව කීමට අවස්ථාව ලබා දෙන්න.
- ''කලිමතුෂ් ෂහාදා'' යන 6 වන පාඩම යොදා ගන්න.

**ක්‍රියාකාරකම 3**

- කලිමතුෂ් ෂහාදාව හා එහි අර්ථය ලියන ලද පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.
- එහි අර්ථය කියා දෙන්න.
- එක් එක් කණ්ඩායමට වෙන වෙන ම එය කීමට අවස්ථාව ලබා දෙන්න.
- පත්‍රිකාව විශාල ව ලියන ලද කලිමතුෂ් ෂහාදාව කොටස් වශයෙන් වෙන් වෙන් ව කපා පෙට්ටියක බහාලන්න.
- ප්‍රදර්ශනය කරන ලද පත්‍රිකාවට අනුව හෝ මතකයෙන් හෝ එම කලිමාව නැවත පිළිවෙළකට සැකසීමට එක් එක් කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.

- පසු ව කණ්ඩායම් ලෙස එය නිවැරදි ව කීමට යොමු කරවන්න.
- ''කලිමා ෂහාදා'' යන 6 වන පාඩම උපයෝගී කර ගන්න.

**ක්‍රියාකාරකම 4**

- අදාන්වලට සවන් දීමට සලස්වන්න. (මස්ජිද්,/CD/පුද්ගලයකු ලවා)
- කෙනකු ලවා අදාන් කීමට සලස්වන්න.
- මේ පිළිබඳ ව ප්‍රශ්න කිහිපයක් විමසන්න.
  - * මෙය මීට පෙර අසා තිබේ ද ?
  - * කොහේ දී ද ?
  - * මේ කියන්නේ ඇයි ?
  - * දවසකට කී වතාවක් ඇසෙයි ද ?
- සලාතය සඳහා කරන ආරාධනාව අදාන් බව පවසන්න.

**තක්සේරුව**

- ''අල් අදාන්'' යන 07 වන පාඩම උපයෝගී කර ගන්න.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අදාන්වලට ගරු කරයි.
- කලිමා ෂහාදාව උචිත අවස්ථාවල භාවිත කරයි.

## 4.0 තේමාව : අත්තහාරා පිළිබඳ ව තේරුම් ගනියි.

**නිපුණතාව 4.0** : **එදිනෙදා ජීවිතයේ දී මුස්ලිම්වරු පිළිපැදිය යුතු සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරයි.**

**නිපුණතා මට්ටම 4.1** :
- ශරීර අවයව පිරිසිදු ව තබා ගනියි.
- අවට පරිසරය පිරිසිදු ව තබා ගනියි.
- යහ පුරුදු පිළිපදියි.
- ඇඳුම් පැලැඳුම් පිරිසිදු ව තබා ගනියි.

**ඉගෙනුම් පල** :
- නිය කැපීමේ වැදගත්කම පිළිබඳ ව දැනුම්වත් වී අනුගමනය කරයි.
- හිසකෙස් පිරිසිදු ව හා පිළිවෙළකට තබා ගනියි.
- පාද නිතර පිරිසිදු ව තබා ගන්නා අතර අවශ්‍ය අවස්ථාවල පාවහන් පලඳියි.
- කිවිසුමක් යන විට අත් ලේන්සුවකින් හා ඇනුම් අරින විට වම් අතින් මුව වසා ගනියි.
- කිවිසුමක් ගිය පසු පහත දුආව කියයි.
- පන්ති කාමරය පිරිසිදු ව තබා ගනියි.
- කුණු කසළ සුදුසු ස්ථානවල දමයි.
- සලාතය සඳහා කරන ආරාධනාව

**ඉගෙනුම් සම්පත්** :
- කවිය ලියන ලද පත්‍රිකාව
- ක්‍රියාකාරකම් 2හි සඳහන් පින්තූර
- අත් ලේන්සුවක් භාවිත කර කිවිසන පින්තූරයක්
- කිවිසුමක් යන විට අත්ලේන්සුව භාවිත නොකරන පින්තූරයක්
- පිරිසිදු ව, පිළිවෙළකට තබා ඇති පන්ති කාමරයේ පින්තූරයක්
- අපිරිසිදු ව, අපිළිවෙළකට තබා ඇති පන්ති කාමරයක පින්තූරයක්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සතියකට වරක් නිය කපා
  දින පතා හිස තෙල් ගල්වා
  උදේ සවස පාද දොවා
  දිය නා වෙමු පිරිසිදු මනා

- මෙම කවිය ලියන ලද පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.
- තාලානුකූල ව ගායනා කරන්න.
- සිසුන් සමඟ ගායනා කරන්න.
- කවියේ අර්ථය සිසුන්ගෙන් විමසා දැන ගන්න.
- හිස, නිය, පාද පිරිසිදු ව තබා ගැනීම පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ''පිරිසිදු ව සිටිමු'' යන 8 වන පාඩම උපයෝගි කර ගන්න.

**ක්‍රියාකාරකම 2**

- පහත පින්තූර ප්‍රදර්ශනය කරන්න.
  - * නිය කොටට කපා පිරිසිදු ව තබා ඇති දෙඅත්
  - * නිය නොකපා අපිරිසිදු ව තබා ඇති දෙඅත්
  - * අලංකාරවත් ලෙස හා පිළිවෙළකට පීරා ඇති හිසක්
  - * අපිරිසිදු, අපිළිවෙළකට ඇති හිසක්
  - * පිරිසිදු පාද
  - * අපිරිසිදු පාද
- මේවා යුගල ලෙස ප්‍රදර්ශනය කරන්න.
- පිරිසිදු හා අපිරිසිදු පින්තූර දකින අවස්ථාවල සිසු හැසිරීම
- පිරිසිදු ව හා අපිරිසිදු ව සිටීම මඟින් ඇති වන ප්‍රයෝජන කළු ලැල්ලේ ලියන්න.
- අල්ලාහ් පිවිතුර ැයි. පිවිතුරු බව අගයයි. අල්ලාහ් අලංකාර යි. අලංකාර සියල්ල අගයයි. එ නිසා අපි ද පිවිතුරු හා අලංකාර දේ අගයමු.
- 8 වන පාඩම උපයෝගි කර ගන්න.

**ක්‍රියාකාරකම 3**

- දින පතා දිය නාන හා සතියකට වරක් නිය කපන සිසුන් හඳුනා ගන්න.
- අඛණ්ඩ ව මෙම ක්‍රියාකාරකම් කරන සිසුන් අගය කරන්න.
- මෙලෙස නොකරන සිසුන් ද මෙලෙස කිරීමට යොමු කරවන්න.
- මෙසේ නොකරන සිසුන්ට අවශ්‍ය මග පෙන්වීම දක්වන්න.

**ක්‍රියාකාරකම 4**

- සිසුන් සියලු දෙනා එක් කණ්ඩායමක් ලෙස ගන්න.
- පොදු ස්ථාන, මහ මග (පදික වේදිකා), මහල් නිවාසවල පඩිපෙළ යනාදි ස්ථානවල කෙළ ගැසීම නිසා ඇති වන අයහපත් බව පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- මේ මඟින් තනි පුද්ගලයකුට බලපෑම් ඇති වනවා පමණක් නොව පරිසරය ද අපිරිසිදු වන බව කියා දෙන්න. (වටහා දෙන්න.)
- මෙලෙස සිදුවන්නේ අපගේ නොසැලකිලිමත්කම නිසා බව වටහා දෙන්න.

**ක්‍රියාකාරකම 5**

- සිසුන් පන්ති කාමරයෙන් පිටතට රැගෙන යන්න.
- රවුමක් ආකාරයට වාඩි කරවන්න.
- ඉස්ලාමීය යහ පුරුදු ගැන සුහද ව කතාබහ කරන්න.
- ඇනුම් අරින විට හා කිවිසුම් අරින විට පිළිපැදිය යුතු පිළිවෙත් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ඇනුම් ඇති වන විට හැකි තාක් එය වළක්වා ගැනීමට උත්සාහ කරන්න.
- ඇනුම් අරින විට වම් අතින් කට වසා ගැනීම.
- ඇනුම අවසානයේ ''අඋඥුබිල්ලා හි මිනෂ්ෂයිකානිර්රජීම්'' ලෙස කියවන්න.
- කිවිසෙන විට අත් ලේන්සුව භාවිත කිරීම.
- වම් පැත්තට හැරී කිවිසුම් අරින්න.
- කිවිසුමෙන් පසු ''අල්හම්දුලිල්ලාහ්'' ලෙස අල්ලාහ්ට ප්‍රශංසා කරන්න.
- මේවා නිවැරදි ව පිළිපැදීමට කියා දෙන්න.
- ''යහ පුරුදු'' යන 10 වන පාඩම උපයෝගි කර ගන්න.

**ක්‍රියාකාරකම 6**

- කෙළ ගසන විට පිළිපැදිය යුතු ඉස්ලාමීය පිළිවෙත් අනුගමනය කරන්න.
- සුදුසු තැන්හි පමණක් කෙළ ගසන්න.
- වම් පැත්තට හැරී නැවී කෙළ ගසන්න.
- අනෙක් අයට පිළිකුලක් නොවන ලෙස කෙළ ගසන්න.
- ''යහ පුරුදු - I'' යන 11 වන පාඩම උපයෝගි කර ගන්න.

**ක්‍රියාකාරකම 7**

- පහත පින්තූර සූදානම් කර ගන්න.
  - * පිරිසිදු වත්, පිළිවෙළකටත් තබා ඇති පන්ති කාමරවල පින්තූර
  - * අපිරිසිදු වත්, අපිළිවෙළකටත් තබා ඇති පන්ති කාමරවල පින්තූර
- මෙම පින්තූර ප්‍රදර්ශනය කරන්න.
- සිසුන්ට තම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න./යොමු කරන්න.
- සිසු අදහස් ගොනු කර/ලබාගෙන කෙබඳු පන්ති කාමරයක් හොඳ ද යන්න විමසන්න.
- කුණු කසල නියමිත ස්ථානවල දැමීමට යොමු කරවන්න.
- සියලු දෙනා පිරිසිදුකම අගයයි යන්න වටහා දෙන්න.
- අල්ලාහ් ද පිරිසිදුකම අගයයි යන්න වටහා දෙන්න.
- ''පන්ති කාමරයේ පිරිසිදුකම'' නම් 11 වන පාඩම යොදා ගන්න.

**තක්සේරුව**

- කිවිසෙන විට අත් ලේන්සුවක් භාවිත කරයි.
- අදාළ දුආව කියයි.
- ඊට ප්‍රති දුආව කියයි.
- ඈනුම් අරින විට මුඛය නිවැරදි ව වසා ගනියි.
- පන්ති කාමරයේ උපකරණ නිසි තැන තබයි.
- පන්ති කාමරය පිරිසිදු ව තබා ගැනීමට උදවු වෙයි.
- කුණු කසළ ඊට අදාළ ස්ථානවල දමයි.
- පොත්පත් පිරිසිදු වත්, පිළිවෙළකටත් තබා ගනියි.
- පන්ති කාමරය පිරිසිදු ව තබා ගනියි.
- කෙළ ගැසීමට නියමිත ස්ථානවල පමණක් කෙළ ගසයි.
- පරිසරය පිරිසිදු වත්, පිළිවෙළකටත් තබා ගැනීමට දායක වෙයි./උපකාර කරයි.
- පාවහන් පළඳියි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ජීවිතයේ විවිධ අවස්ථාවල පිරිසිදුකම රැක ගැනීමට වග බලා ගනියි.
- ඉස්ලාමීය යහ පුරුදු පිළිපදියි.

## 5.0 තේමාව : ඉස්ලාමීය ආචාර ධර්ම

**නිපුණතාව 5.0** : **දෛනික ජීවිතයේ දී මුස්ලිම් ආචාර ධර්ම අඛණ්ඩ ව පිළිපදියි.**

**නිපුණතා මට්ටම 5.1:** • නිඳන ස්ථානය හා ඇතිරිලි ආදිය පිරිසිදු ව තබා ගනියි.

**ඉගෙනුම් පල** :
- නිවැරදි ඉරියවු අනුව නිඳා ගැනීම යහපත් පුරුද්දක් ලෙස පිළිපදියි.
- නිඳන ඇතිරිල්ල, කොට්ට මෙට්ට ආදිය පිරිසිදු ව තබාගනියි.
- නින්දට පෙර උසුරුවන දුආ උසුරුවයි.
- වැසිකිළියට යන විට පාවහන් පලඳියි.
- වැසිකිළි පාවිච්චියෙන් පසු නිවැරදි ව පිරිසිදු වෙයි.
- වැසිකිළියට ඇතුළු වන විට වම් පාදය පෙරටු කර ගනියි; පිට වන විට දකුණු පාදය පෙරටු කර ගනියි.
- එහි ඇතුළු වන විට හා පිටතට එන විට ඉසිරවිය යුතු දුආවන් උසුරුවයි.
- දෙඅත් සබන් දා සෝදයි. පාද ද පිරිසිදු කර ගනියි.

**ඉගෙනුම් සම්පත්** :
- නිවැරදි ඉරියවුවලින් නිඳන පින්තූර
- වැසිකිළියට ඇතුළු වන, පිටතට එන පින්තූර
- මෙම අවස්ථාවල උසුරුවන දුආ ලියන ලද පත්‍රිකා

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- ප්‍රායෝගික ක්‍රියාකාරකම් කිරීමට උචිත ලෙස පන්ති කාමරය සකසා ගන්න.
- විවිධ ඉරියවුවලින් නිඳන පින්තූර සිසුන්ට පෙන්වන්න.
- ඒ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- නිවැරදි ක්‍රමය ගෙන හැර දක්වන්න.
- එය ප්‍රායෝගික ව කරවන්න.
- ''ආචාර ධර්ම පිළිපැදීම'' නම් 12 වන පාඩම උපයෝගී කර ගන්න.

**ක්‍රියාකාරකම 2**

- නින්දට පෙර, නින්දෙන් පසු, වැසිකිළියට ඇතුළු වන විට, පිට වන විට, කියන දුආ වෙන වෙන ම කාඩ්පත්වල ලියා ගන්න.
- පන්තියේ සිසුන් සියලු දෙනා එක් කණ්ඩායමක් ලෙස ගන්න.
- කාඩ්පත්වල ලියන ලද දුආ හොඳින් පෙනෙන ලෙස ප්‍රදර්ශනය කරන්න.
- මෙම දුආ කටපාඩම් සිසුන් හඳුනාගෙන ඔවුන්ට පන්ති කාමරයේ ඉදිරියට පැමිණ එය කීමට අවස්ථාව සලස්වන්න./ලබා දෙන්න.
- කටපාඩම් නැති සිසුන් කටපාඩම් කර ගැනීමට යොමු කරවන්න.
- නිවැරදි උච්චාරණයෙන් යුතු ව දුආවන් කියා දී එය නිවැරදි ව කීමට සිසුන් යොමු කරවා ගන්න.
- දුආවන් මඟින් අප අයහපත් දේවලින් වළක්වයි යන්න වටහා දෙන්න.
- ''ආචාර ධර්ම පිළිපැදීම I, II ''පාඩම 12, 13 යොදා ගන්න.

**ක්‍රියාකාරකම 3**

- සිසුන් පන්ති කාමරයෙන් පිටත සුදුසු එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- සිසුන් රවුමකට වාඩි කරවන්න.
- පහත පින්තූර කලින් සකස් කර ගන්න.
    - * වැසිකිළියට යන විට පාවහන් පැලඳ සිටීම
    - * වම් පාදය පෙරට තබා වැසිකිළියට ඇතුළු වීම
    - * වැසිකිළියෙන් පිටත පැමිණෙන විට දකුණු පාදය පෙරටු කර ගැනීම.
    - * වැසිකිළි භාවිතයෙන් පසු වැසිකිළිය ජලය යොදා පවිත්‍ර කිරීම.
    - * දෙඅත් සබන් ගා සේදීම.
    - * පාද ද පවිත්‍ර කර ගැනීම.
- මෙම පින්තූර අපිළිවෙළට ප්‍රදර්ශනය කරන්න. පසු ව සිසුන් 4 දෙනෙකු පන්තිය ඉදිරියට ගෙන්වා ඒවා නිවැරදි ව පිළිවෙළකට පෙන්වීමට සලස්වන්න.
- පිළිවෙළකට කරන සිසුන් අගය කරන්න.
- උදවු අවශ්‍ය සිසුන්ට මඟ පෙන්වන්න.
- වැසිකිළි භාවිතයේ නිවැරදි ක්‍රම පිළිබඳ ව සිසුන් දැනුම්වත් කිරීමට අවශ්‍ය පින්තූර ද උපයෝගි කර ගන්න.
- ''ආචාර ධර්ම II '' යන 13 වන පාඩම යොදා ගන්න.

**තක්සේරුව**

- නිඳන ස්ථානය පිරිසිදු ව තබා ගනියි.
- නිඳන ඇතිරිල්ල, කොට්ට, මෙට්ට පිළිවෙළකට හා පිරිසිදු ව තබාගනියි.
- නින්දට පෙර උසුරුවන දූආව උසුරුවයි.
- වැසිකිළියට යන විට පාවහන් පළඳියි.
- වැසිකිළි ගිය පසු ජලය දමා පවිත්‍ර කරයි.
- වැසිකිළියට ඇතුළු වන විට වම් පාදය පෙරටු කර ගනියි.
- වැසිකිළියෙන් පිටතට එන විට දකුණු පාදය පෙරටු කර ගනියි.
- වැසිකිළියට ඇතුළුවන විට හා පිටතට එන විට උසුරුවන දූආවන් නිවැරදි ව උසුරුවයි.
- දෙඅත් සබන් ගා පිරිසිදු කර ගනියි.
- පාද ද පිරිසිදු කර ගනියි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- නින්දට පෙර, නිදා ගන්නා අවස්ථාවේ වැසිකිළියට ඇතුළු වීම, පිට වීම, පිරිසිදු වීම පිළිබඳ නිවැරදි ක්‍රම අනුගමනය කරයි.

# 6.0 තේමාව : අඛ්ලාක් හා ආදාබ් දෛනික ජීවිතයේ පිළිපදියි.

**නිපුණතාව** : **සාමූහික ජීවිතයට අදාළ ගුණධර්ම හා සාරධර්ම (අඛ්ලාක් හා ආදාබ්) පිළිපදියි.**

**නිපුණතා මට්ටම 6.1:**
- මුස්ලිම්වරුන් අනෙකුත් අය සමඟ ගරුත්වයෙන් හැසිරෙන ආකාරය දැනගෙන තමා ද එය පිළිපදියි.
- ආලිම්වරුන්ගේ, ගුරුවරුන්ගේ උපදෙස් අනුව ක්‍රියා කරයි.
- අසල්වැසියන් සමඟ ආදරයෙන් හා ගරුසරු ව හැසිරෙයි.

**ඉගෙනුම් පල** :
- අනෙකුත් අයට ආදරය, කරුණාව, ගරු කිරීම මුස්ලිම්වරුන්ගේ වටිනා යහගුණයක් බව පවසා එය පිළිපදියි.
- ආලිම්වරුන්, ගුරුවරුන් හා අසල්වැසියන් සමඟ ආදරයෙන් හා ගරුසරු ව හැසිරෙයි.
- අසල්වැසියන් සමඟ සහජීවනයෙන් ජීවත් වෙයි
- ආලිම්වරුන්ගේ, ගුරුවරුන්ගේ යහපත් උපදෙස් නිසි ලෙස පිළිපදියි.
- යහපත් මුස්ලිම් දරුවකු ලෙස හැසිරෙයි.
- අනෙක් අයට උදවු උපකාර කරයි.
- යහපත් දේ කිරීමෙන් ස්වර්ගයත්, අයහපත් දේ කිරීමෙන් නිරයත් අත්වන බව දැන පවසයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- පන්තිය 6 දෙනා බැගින් කණ්ඩායම්වලට වෙන් කර ගන්න.
- ආලිම්වරුන්, ගුරුවරුන්, අසල්වැසියන් දැක්වෙන පින්තූර සිසුන්ට පෙන්වන්න.
- අසල්වැසියන් පිළිබඳ ප්‍රශ්න කිහිපයක් අසා ලැබෙන පිළිතුර කළු ලෑල්ලේ ලියන්න.
- අසල්වැසියෝ යනු කවුරු ද, ඔවුන් හා අප අතර සම්බන්ධය කුමක් ද ? මිනිසුන් ලෙස ඔවුන්ට කළ යුතු යුතුකම් මොනවා ද ?
- අසල්වැසි කුඩා දරුවන් සමඟ කෙසේ ක්‍රියා කරන්නේ ද ?
- අවට පරිසරයේ සතුන් සමඟ ඔබ කෙසේ හැසිරෙනවා ද ?
- අප විසින් අසල්වැසියන්ටත්, අසල්වැසියන් විසින් අපටත් කරන සේවා මොනවා ද ?
- ඒවා පිළිවෙළකට දක්වන්න.
- ගුරුවරිය පෙර සූදානමින් රැගෙන ආ පිළිතුරු දරුවන්ට වටහා දෙන්න.
- පෙළ පොත 14 පාඩම (ගරුසරු ව හැසිරෙමු.)

**ක්‍රියාකාරකම 2**

01.
- ආලිම්වරයකුගේ පින්තූරය පෙන්වා ඒ පිළිබඳ කතාබහ කරන්න.
- ඔබ දන්නා ආලිම්වරුන්ගේ නම් කියන්න.
- ආලිම්වරු යනු කවුරු ද ?
- අනෙක් අය හා ආලිම්වරුන් අතර වෙනස කුමක් ද ?
- ඔවුන් කරන කාර්යභාරය කුමක් ද ?
- ඔවුන් සේවය කරන්නේ කොහේ ද ?
- ඔවුන්ට ගරු කළ යුත්තේ ඇයි ?
- ඔවුන්ට කෙසේ ගරු කළ යුතු ද යන කරුණු පිළිබඳ ව කතාබහ කරන්න.

02. ආලිම්වරුන් පිළිබඳ ඉදිරිපත් කළ අදහස් එකතු කරගන්න.

03. • ගුරුවරුන් හා ආලිම්වරුන් ගරු කළ යුතු පුද්ගලයන් බව කියා දෙන්න.
 • ''ආලිම්වරු'' යන 15 පාඩම උපයෝගි කර ගන්න.

**ක්‍රියාකාරකම 03**

- ගුරු භූමිකා පින්තූරයක් හෝ ගුරුවරයකු හෝ පෙන්වා ළමයින් සමග සාකච්ඡා කරන්න.
  * ඔබ දන්නා එක් ගුරුවරයකු නම් කරන්න.
  * ගුරුවරයා යනු කවරෙක් ද ?
  * ඔවුන් අනෙකුත් අයගෙන් වෙනස් වන්නේ කෙසේ ද ?
  * ඔවුන්ගේ කාර්යභාරය කුමක් ද ?
  * ඔවුන්ට ගරු කළ යුත්තේ ඇයි ?
  * ඔවුන්ට කෙසේ ගරු කළ යුතු ද යන කරුණු පිළිබඳ ව කතාබහ කරන්න.
- ළමයින් ඉදිරිපත් කරන අදහස් ගොනු කර ගන්න.
- ගුරවරුන් සැම විට ම ගරු කළ යුතු පුද්ගලයන් බව වටහා දෙන්න.
- ගුරවරුන් - ආලිම්වරුන් අතර සමානකම් හා අසමානකම් විමසන්න.
- ''ගුරුවරුන්'' යන 16 පාඩම යොදා ගන්න.

**ක්‍රියාකාරකම 04**

- සිසුන් එළිමහනට රැගෙන යන්න.
- රවුමක ආකාරයෙන් ඉඳ ගැනීමට සලස්වන්න.
- පෙළ පොතෙහි දී ඇති ගීතය තාලයට ගායනා කර දක්වන්න.
- සිසුන්ට ද එක් ව ගායනා කිරීමට සලස්වන්න.
- පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් ලෙස ගීතය ගායනා කරන්න.
- ගීතයේ අඩංගු ආදර්ශ පිළිබඳ විමසන්න.
- එම ආදර්ශ පිළිපැදීමට යොමු කරන්න.
- ''ආදර්ශවත් දරුවා'' , ''උදවු කරමි'' ආදි පාඩම් (17, 18) යොදා ගන්න.

**තක්සේරුව**

- අන් අය කෙරෙහි හා සැම ජීවියකු කෙරෙහි ආදරය, කරුණාව දක්වයි.
- අනෙක් අය කෙරෙහි ගරුසරු ව හැසිරෙයි.
- වැඩිහිටියන්ට ගෞරව කරයි.
- අනෙකුත් අයට උදවු උපකාර කරයි.
- අසල්වැසියන් සමඟ ආදරයෙන් හා ගරුසරු ව හැසිරෙයි.
- ආලිම්වරුන්, ගුරුවරුන් සමඟ ආදරයෙන් හා ගරුසරු ව හැසිරෙයි.
- ආලිම්වරුන්ගේ, ගුරුවරුන්ගේ යහපත් උපදෙස් පිළිපදියි.
- යහපත් මුස්ලිම් දරුවකු ලෙස හැසිරෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අසල්වැසියන්ට ගරු කරමින් උපකාර කරමින් සහ ආලිම්වරුන්ට හා ගුරුවරුන්ට ගරුත්වයෙන් හැසිරෙයි.

## 7.0 තේමාව : නබි (සල්) තුමාගේ ආදර්ශ

**නිපුණතාව 7.0** : **නබි (සල්) තුමා කෙරෙහි සෙනෙහස දක්වමින් හා නබි (සල්) තුමාගේ ආදර්ශ පිළිපදියි.**

**නිපුණතා මට්ටම 7.2:1**
- නබි (සල්) තුමාණන්ගේ තරුණ ජීවිතයේ ආදර්ශයන් පවසයි.
- එතුමා අවසාන දූතයා බව පවසයි.
- එතුමාගේ ආදර්ශ පිළිපදියි.
- එතුමාණන්ට සලවාත් පවසයි.
- කුඩා දරුවන්ට ආදරය දක්වයි. වැඩිහිටියන්ට ගරු කරයි.

**ඉගෙනුම් පල** :
- නබි (සල්) තුමාගේ කුඩා අවධිය පිළිබඳ දැන පවසයි.
- නබි (සල්) තුමා අවසාන දූතයා බව පිළිගෙන පවසයි.
- එතුමාගේ නමට සලවාත් පවසයි.
- එතුමාගේ ආදර්ශ අනුව කුඩා දරුවන්ට සෙනෙහස දක්වයි.
- නබි (සල්) තුමාගේ ආදර්ශ අනුව වැඩිහිටියන් සමඟ ගරුසරු ව හැසිරෙයි.

**ඉගෙනුම් සම්පත්** :
- කවි/ගීත ලියන ලද කාඩ්පත්, CD තැටි

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- පහත ගායනය (ගීතය) ළමයින්ට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන්න.

ආමිනා මවු කුසෙහි
මෙලොව එළිය දුටු අප නබි
හාලිමා මාතාවගෙන් කිරි බී
සෞම්‍ය ලෙස වැඩුණු අප නබි

ඉපදීමට පෙර පියා ද
සය වයසෙ දි මව ද
අහිමි වූ අප නබි
අබ්දුල් මුත්තලෆ් රැකවරණ ලබා

අනාථයකු ලෙස හැදී වැඩුණත්
යහපත් ගති ලැබූ අප නබි
මිනිසුන්ට යහමඟ පෙන්වමිනේ
මක්කා නගරේ ජීවත් වූ
එතුමා කෙරෙහි සලාවත් හා
සලාම් පවසා
දෙඅත් ඔසවා ප්‍රාර්ථනා කර
සෙනෙහේ දක්වමු හොඳිනේ

අවසාන රසූල් එතුමා ම වේ.
කිසිවෙක් නොපැමිණේ මින් මතුවට
එතුමා වේ අවශ්‍ය දූතයා
ස්ථිර යි මෙය සැම දාක ම !

- ගායනය ඇසීමට (CD)/බැලීමට (කාඩ්පත්) සකස් කරගන්න.
- සාමූහික ව ගායනා කරන්න.

- තාලානුකුල ව ගායනා කරන්න.
- ගායනයට අනුව නබි (සල්) තුමා පිළිබඳ සාකච්ඡා කරන්න.
- ''නබි (සල්) තුමා - අවසාන නබි'' යන 19, 20 පාඩම උපයෝගි කර ගන්න.

**ක්‍රියාකාරකම 2**

- පහත අවස්ථා (සිද්ධි) කතන්දර ස්වරූපයෙන් කියා දෙන්න.
  - * එක්තරා මැහැල්ලක ආවා
  - * නබි (සල්) තුමා හමු වුණා.
  - * සබි (සල්) තුමා තම උරහිස මත දමා තිබූ සළුව ගත්තා.
  - * එය බිම එළුවා.
  - * එම මැහැල්ල එහි වාඩි කෙරෙව්වා
  - * ඒ එතුමාට කිරි පෙවූ මව හලිමා තුමිය යි.
- මෙම සිද්ධිය මඟින් වැඩිහිටියන්ට ගරු කළ යුතු බව ළමයින් සමඟ කතාබහ කරන්න.
- ''සැම කෙනාටම නබි'' නම් 21 වන පාඩම යොදා ගන්න.

**ක්‍රියාකාරකම 3**

- දිනක් නබි (සල්) තුමා තම මිනිබිරිය සමඟ මස්ජිදයට පැමිණියා.
- සලාතය ඉටු කරමින් සිටියා.
- එතුමා සුජූද් කරන විට මිනිබිරිය එතුමාගේ කර මත වාඩි වුණා.
- එම කුඩා දැරිය උරහිස (කර මතින්) ඉවත් වන තුරු එතුමා සුජූදය දීර්ඝ කළා.
- සලාතයෙන් පසු සහාභාවරුන් මේ පිළිබඳ න විමසුවා.
- තම මිනිබිරියගේ සතුට (සවාරිය) නැති කිරීමට එතුමා කැමති වූයේ නැත.
- මේ මඟින් එතුමා කුඩා දරුවන්ට ආදරය දැක්වීම පිළිබඳ ආදර්ශය කියා දෙන්න.
- ''යහපත් ගුණාංග'' යන 22 වන පාඩම යොදා ගන්න.

**තක්සේරුව**

- නබි (සල්) තුමාගේ කුඩා කාලය පිළිබඳ ව දැන පවසයි.
- නබි (සල්) තුමා අවසාන දූතයා බව පිළිගෙන පවසයි.
- නබි (සල්) තුමාගේ නම ඇසෙන විට සලවත් කියයි.
- කුඩා දරුවන්ට ආදරය/සෙනෙහස දක්වයි.
- වැඩිහිටියන් සමඟ ගරුසරු ව හැසිරෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- නබි (සල්) තුමා තුළ කුඩා කල සිට ම තිබූ යහපත් ආදර්ශ තමා ද පිළිපැද අනෙකුත් අයට ද පිළිපැදීමට පැවැසීම.

# 8.0 තේමාව : අල් - කුර්ආනය දැන පාරායණය කරමු. (කියවමු)

**නිපුණතාව 8.0** : **අල් - කුර්ආනය දැන පාරායණය කරන අතර එහි ඉගැන්වීම් කරුණු පිළිපදියි.**

**නිපුණතා මට්ටම** :
- සූරා - ඉක්ලාස් නිවැරදි ව උච්චාරණයෙන් යුතු ව කියවයි. (පාරායණය කරයි.)
- සුදුසු අවස්ථාවන් හි පාරායණය කරයි.

**ඉගෙනුම් පල** :
- සූරා - ඉක්ලාස්වල වැදගත්කම දැනගෙන පවසයි.
- සූරා - ඉක්ලාස් නිවැරදි ව උසුරයි.
- සුදුසු අවස්ථාවන්හි එය උසුරයි.

**ඉගෙනුම් සම්පත්** :
- සූරා - ඉක්ලාස් ලියන ලද පත්‍රිකා
- CD තැටි

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සිසුන්ට සූරා - ඉක්ලාස් සවන්දීමට හැකි අයුරින් අසුන් ගන්වන්න.
- සූරා - ඉක්ලාස් ලියන ලද පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.
- සූරා ඉක්ලාස් පාරායණය කර පෙන්වන්න.
- එය සාවධානව සවන්දීමට සලස්වන්න.
- එක් එක් ආයතය නිවැරදි ව උසුරා සිසුන්ට ද උසුරීමට අවස්ථාව ලබා දෙන්න.
- උසුරන ගමන් ප්‍රදර්ශනය කරන ලද පත්‍රිකාව කෙරෙහි ද අවධානය යොමු කරවන්න.
- ගුරුවරිය පෙන්නුම් කරන කොටස සිසුන්ට උසුරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරිය සිසුන් සමඟ කිහිප වතාවක් මෙය නිවැරදි ව පාරායණය කරන්න.
- ''සූරතුල් ඉක්ලාස්'' නම් 23 වන පාඩම උපයෝගි කර ගන්න.

**තක්සේරුව**

- සූරතුල් ඉක්ලාස් නිවැරදි උච්චාරණයෙන් යුතු ව පාරායණය කරයි.
- සුදුසු අවස්ථාවන්හි එය පාරායණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සූරා ඉක්ලාස් කට පාඩම් කරගෙන කියයි. (පාරායණය කරයි.)

## 9.0 තේමාව : මස්ජිදය පූජනීය ස්ථානයක් බව හඳුනා ගනියි.

**නිපුණතාව** : **මස්ජිදය යනු මුස්ලිම්වරුන්ගේ පූජනීය ස්ථානයක් බව පවසයි.**

**නිපුණතා මට්ටම** :
- මස්ජිදය පූජනීය ස්ථානයක් බව පවසයි.
- එය අල්ලාහ්ගේ මාලිගාව බව පවසයි.
- මස්ජිදයට පිරිසිදු ව යා යුතු බව පිළිගෙන එය පිළිපදියි.
- මස්ජිදයට සංවර ව පිවිසෙයි. එහි ඇතුළත නිශ්ශබ්දව හැසිරෙයි.

**ඉගෙනුම් පල** :
- මස්ජිදයට යෑමට සූදානම් වීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් අනුගමනය කරයි.
- මස්ජිදය තුළ අනුගමනය කළ යුතු පිළිවෙත් දැන හඳුනාගෙන පිළිපදියි.
- අනුගමනය කළ යුතු නිවැරදි පිළිවෙත් අනුගමනය කර මස්ජිදයට යයි.

**ඉගෙනුම් සම්පත්** :
- විවිධ මස්ජිදවල පින්තූර (ඇතුළත, පිටත)

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- මස්ජිදය පාලනය (ඉමාම්, මුඅස්සින්) සමඟ කතාබහ කර අවශ්‍ය කටයුතු සංවිධානය කර ගන්න.
- අසල පිහිටි මස්ජිදයකට සිසුන් රැගෙන යන්න.
- සිසුන් කැඳවාගෙන යාමට පෙර පහත දේවල් කෙරෙහි අවධානය යොමු කරන්න.
  * ගැළපෙන පිරිසිදු ඇඳුම් පැලැඳුම්
  * අනුමත කරන ලද සුවඳ විලවුන් භාවිතය
- මස්ජිදය තුළට පිවිසෙන විට අනුගමනය කළ යුතු පිළිවෙත් අනුගමනය කරන්න.
  * පිළිවෙළකට හා අනෙකුත් අයට බාධා නොවන ලෙස හැසිරෙන්න.
  * පාවහන් ගලවා ඇතුළු වන්න.
  * පිළිවෙළකට, නිශ්ශබ්ද ව පේළියකට මස්ජිදය නිරීක්ෂණය කරන්න.
  * අනවශ්‍ය කතාබහවලින් මිදී කටයුතු කරන්න.
  * මස්ජිදය ඇතුළත හා පිටත නිර්මාණය වී ඇති ආකාරය සහ ක්‍රියාවන් පිළිබඳ ව කියා දෙන්න.
  * කතීබ්/ඉමාම් හමු වී මස්ජිදය තුළ හැසිරිය යුතු ආකාරය පිළිබඳ ව අසා දැන ගන්න.
  * පිළිවෙළකට මස්ජිදයෙන් පිටත පැමිණීමට සිසුන් යොමු කරවන්න.

**තක්සේරුව**

- මස්ජිදය තුළට පිවිසීමට පෙර ශරීරය පිරිසිදු කර ගනියි.
- පිරිසිදු හා ගැළපෙන ඇඳුමෙන් සැරසී යයි.
- පාවහන් ගලවා නිසි ලෙස තබා මස්ජිදයට ඇතුළු වෙයි.
- නිශ්ශබ්ද ව සංවර ව හැසිරෙයි.
- මස්ජිදය පූජනීය ස්ථානයක් බව පිළිගනියි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- මස්ජිදයට ගරු කරයි.
- මස්ජිදය සමඟ යහපත් සම්බන්ධතාවක් පවත්වා ගෙන යයි. (නිතර යෑම)

## 10.0 තේමාව : ඉස්ලාමීය ඉතිහාසයේ බිහිවුණු විද්වතුන් හඳුනා ගැනීම

**නිපුණතාව 10.0** : **ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විද්වතුන්ගේ ක්‍රියාකලාප ආදර්ශයට ගෙන පිළිපදියි.**

**නිපුණතා මට්ටම** :
- අබ්දුල් කාදර් ජීලානි තුමාගේ ජීවිත කතාව කෙටියෙන් හඳුනා ගනියි.
- එතුමාණන්ගේ ආදර්ශ පිළිගෙන පිළිපදියි.

**ඉගෙනුම් පල** :
- අබ්දුල් කාදර් ජීලානි තුමා ගැන කරුණු පවසයි.
- අබ්දුල් කාදර් ජීලානි තුමා ව ආදර්ශයට ගෙන නිතර ඇත්ත කතා කරයි.
- අබ්දුල් කාදර් ජීලානි තුමා අධ්‍යාපනය ලැබීමට දැරූ වෙහෙස පිළිබඳ වටහා ගෙන තමා ද ඉගෙනීමෙහි යෙදෙයි.

**ඉගෙනුම් සම්පත්** :
- අබ්දුල් කාදර් ජීලානි තුමා පිළිබඳ ගීත හා ජීවිත සිද්ධි අඩංගු පොත්පත්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සිසුන් කතන්දරයක් ඇසීමට සුදුසු ලෙස අසුන් ගන්වන්න.
- පහත අවස්ථා මගින් ඉස්ලාමීය ඉතිහාසය පිළිබඳ ව කියා දෙන්න.
- එහි අවස්ථාවල සිසුන්ට සුදුසු ලෙස කතන්දර ස්වරූපයෙන් කියා දෙන්න.
- මෙම කතාවේ සත්‍ය කතා කිරීම, දෙමාපිය කීමට අවනත වීම, අධ්‍යාපනයේ වටිනාකම වටහා ගැනීම, අධ්‍යාපනයේ ඉහළ තත්ත්වයකට පත් වීම ආදි කරුණු පිළිබඳ ව සිසුන් තුළ හොඳ වැටහීමක් ඇති කරන්න.
  * කුඩා කල සිට සත්‍ය කතා කිරීම
  * මවගේ කීමට අවනත වීම
  * මිනිසුන්ට යහමඟ පෙන්නුම් කිරීම
  * ආගමික මාර්ගයේ හැසිරීම
  * අපත් එතුමා මෙන් නිවැරදි මඟ ගොස් හොඳ අධ්‍යාපනයක නිරත වීම

**තක්සේරුව**

- මවගේ කීමට අවනත ව ක්‍රියා කරයි.
- අධ්‍යාපනයේ (ඉගෙනුමෙහි) හොඳින් නිරත වෙයි.
- මිනිසුන්ට යහපත් දේ සිදු කරයි.
- ආගමානුකූල ව හැසිරෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අබ්දුල් කාදර් ජීලානි තුමාගේ ජීවිත චරිතය අනුගමනය කරයි. (සත්‍ය කතා කිරීම, මවට අවනත වීම)

# ඉස්ලාම් - තක්සේරු කිරීමේ පත්‍රිකාව

| | | | | සිසුන්ගේ නම් <br> ප්‍රවීණතා මට්ටමට පැමිණ ඇත <br> ප්‍රවීණතා මට්ටමට පැමිණ නැත • |
|---|---|---|---|---|
| | | | | 1. සියල්ලෙහි මැවුම්කරු අල්ලාහ් ලෙස පිළිගෙන පවසයි. |
| | | | | 2. විශ්වාස කළ යුතු අංග හය පවසයි. |
| | | | | 3. අල්ලාහ් සියල්ල පරිපාලනය කරන බව පිළිගෙන කියාපායි. |
| | | | | 4. මලාඉකාවරු පිළිබඳ විශ්වාස කර ක්‍රියා කරයි. |
| | | | | 5. කලිමතුෂ් ෂහාදා හා එහි අර්ථය පවසයි. |
| | | | | 6. 'අදාන්' කටපාඩම් කර පවසයි. |
| | | | | 7. තමා හා තමා අවට දෑ පිරිසිදුව තබා ගනියි. |
| | | | | 8. ඇඳුම් පැළඳුම් පිරිසිදුව තබා ගනියි. |
| | | | | 9. කිවිසන විට දී හා ඈණුම් අරින විට නිසි පිළිවෙත් අනුගමනය කරයි. |
| | | | | 10. නිදා ගැනීමේ දී නිදන ස්ථානය හා අවට පිරිසිදුව තබා ගනියි. |
| | | | | 11. නිදා ගැනීමේ දී හා නින්දෙන් අවදි වීමේ දී උසුරන දුආ ප්‍රාර්ථනාවන් කටපාඩම් කර පවසයි. |
| | | | | 12. ආලිම්වරුන්ට හා ගුරුවරුන්ට ගරු කරමින් හැසිරෙයි. |
| | | | | 13. ආලිම්වරුන් හා ගුරුවරුන් සමඟ ගුණගරුක ව හැසිරෙයි. |
| | | | | 14. නබි (සල්) තුමාගේ බාල කාල පූර්වාදර්ශ පිළිගෙන හැසිරෙයි. |
| | | | | 15. සූරා ඉක්ලාස් නිවැරදි ව කියවයි. |
| | | | | 16. සූරා ඉක්ලාස් කටපාඩම් කර පවසයි. |
| | | | | 17. මස්ජිද්හි පිළිපැදිය යුතු පිළිවෙත් පවසයි. |
| | | | | 18. මස්ජිද්හි පිළිවෙත් පිළිපදියි. |
| | | | | 19. මස්ජිදයට යාම් ඊම් කරයි. |
| | | | | 20. අබ්දුල් කාදිර් ජීලානිතුමාගේ පූර්වාදර්ශ පවසයි. |
| | | | | 21. අබ්දුල් කාදිර් ජීලානිතුමාගේ පූර්වාදර්ශ පිළිපදියි. |